# ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

# පුරප්පාඩු

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව රජයේ රෝහල් සඳහා අවශ්‍ය ඖෂධ හා ශල්‍ය උපකරණ ආනයනය කරන එකම රාජ්‍ය ආයතනය වන අතර, පුද්ගලික අංශය සඳහා ඖෂධ ආනයනය කර බෙදහැරීමේ ප්‍රමුඛතම ආයතනය ද වේ.

අප ආයතනය පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා පහත පරිදි සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**කළමනාකරු (පර්යේෂණ හා නව ව්‍යාපෘති) (MM 1.1) II ශ්‍රේණිය - පුරප්පාඩු 01**

**සුදුසුකම්**

(අ) I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ප්‍රථම උපාධිය හෝ අලෙවිකරණය / වාණිජ්‍යය / ව්‍යාපාර පරිපාලනය / ආර්ථික විද්‍යාව පිළිබඳව විද්‍යාවේදී විශේෂ උපාධියක් ලබා තිබීම

හෝ

II. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් / ආයතනයකින් ලබාගත් වෙනත් ඒ හා සමාන උපාධියක් ලබා තිබීම

සහ

(ආ) පරිගණක සාක්ෂරතාවය

සහ

(ඇ) රජයේ / සංස්ථා / මණ්ඩල / ව්‍යවස්ථාපිත ආයතනයක / හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක සැලසුම්කරණය ක්ෂේත්‍රයට අදාළව අවම වශයෙන් වසර 03 ක පශ්චාත් සේවා පළපුරුද්ද

**වැටුප් පරිමාණය** : රු. 66,470/-, 1,720/- X 10, 2,390/- X 15 = 119,520/-
(දළ මාසික වේතනය රු. 171,880/- ක් පමණ වනු ඇත)

**වයස් සීමාව** : වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා බලානොපායි)

**ආයතනික ප්‍රතිලාභ :**

තෝරා ගත් අයදුම්කරුවන් හට මාසික පැමිණීමේ දිරි දීමනාව, ලබා නොගත් නිවාඩු සඳහා මුදල් ප්‍රතිපූර්ණය, වාර්ෂික ප්‍රසාද දීමනා, සමාජයීය ප්‍රතිලාභ, වෛද්‍ය ප්‍රතිලාභ හා සේවකයා හා පවුලේ අය සඳහා රෝහල්ගත වීමේ වෛද්‍ය රක්ෂණාවරණය ඇතුළු ප්‍රතිලාභ රැසක් හිමි වේ.

අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කළ ජීව දත්ත සමග අයදුම්පතෙහි වයස, සුදුසුකම්, පුහුණුව, සේවා පළපුරුද්ද, වත්මන් තනතුර, වැටුප හා වැටුප් පරිමාණය, දරන ලද පෙර තනතුරු හා පෙර සේවා යෝජකයන්ට සම්බන්ධ වූ සහ ඉවත් වූ දිනයන් යන කරුණු ඇතුලත් කොට ජාතික හැඳුනුම්පතෙහි පිටපතක්, සහතිකවල පිටපත් සහ ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සමග යොමු කළ යුතුය. අදාළ සහතිකවල පිටපත් නොමැතිව යොමු කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන බව කරුණාවෙන් සලකන්න.

අයදුම්පත් බහාලූ ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන ලද තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. රාජ්‍ය අංශයේ සේවයේ නියුතු අයුම්කරුවන් තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් යොමු කළ යුතුය. සියලුම අයදුම්පත් 2025.06.23 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් යොමු කළ යුතුය.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පරිපාලන),**
**ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව,**
**"මෙහෙවර පියෙස", 16 වන මහල,**
**නො. 41, කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05.**
**දුරකථන අංකය : 0112320356-9**